# චීන මිලිටරි සයන්ස් ඇකඩමි නියෝජිතයෝ පාත්ෆයින්ඩර් පදනම සමඟ සාකච්ඡාවක






චීන මිලිටරි සයන්ස් ඇකඩමියේ දේශපාලන කොමසාරිස්, මේජර් ජෙනරාල් ලියු රෙනික්ෂන් ඇතුළු පිරිසක් පසුගියදා මෙරටට පැමිණ පාත්ෆයින්ඩර් පදනම සමඟ සාකච්ඡාවක නිරත විය. ඉන්දියන් සාගරයේ ස්වභාවය හා දෙරට අතර සහයෝගීතාව සම්බන්ධයෙන් උපායශිලී සම්බන්ධතාවයක් වෙනුවෙන් ආයතන දෙක එකතු වී ක්‍රියාකරනු ඇත. පාත්ෆයින්ඩර් පදනමේ නිර්මාතෘ මිලින්ද මොරගොඩ මහතා මේජර් ජනරාල්වරයා ඇතුළු පිරිස සමඟ කරන ලද සාකච්ඡාවේ දී පදනම මගින් සම්පාදනය කරන ලද වසර 2020 සඳහා වූ ජාතික ආරක්ෂක උපායමාර්ග සංග්‍රහයේ පිටපතක් ද පිළිගැන්විය. පදනමේ සභාපති බර්නාඩ් ගුණතිලක, අධ්‍යක්ෂ අද්මිරාල් ජයනාත් කොළඹගේ, විධායක අධ්‍යක්ෂ ලක්ෂමන් සිරිවර්ධන යන මහත්වරු ද මෙම අවස්ථාවට සහභාගී වූහ.

එක මාවතක්, එක තීරුවක් යන නව සේද මාවත සංකල්පය අනුව ශ්‍රී ලංකාව වැදගත් ස්ථානයක් උසුලන අතර ද්වි පාර්ශ්වික සම්බන්ධතා ආර්ථීක හා සමාජ අභිවෘද්ධිය ඇති කරනු ඇති බව චීන නියෝජිතයන් මෙහිදී පෙන්වා දී තිබේ.